MIHIN LANKA

## රාජ්‍ය සේවයේ නියුතු භවතුන් සඳහා මිහින් ලංකා පිරිනමන වාරික වශයෙන් ගෙවීමේ පදනම මත දඹදිව, ට්‍රිචි සහ වෙනත් ගමනාන්ත දක්වා ගුවන් ටිකට්පත් ලබාදීම

මහින්ද චින්තනයෙන් බිහිවූ මිහින් ලංකා ගුවන් සේවය කොළඹ සිට දඹදිව, බුද්ධගයා සහ බරණැස දක්වා සෘජු ගුවන් ගමන් පවත්වන එකම ගුවන් සේවයයි. සම්පූර්ණයෙන්ම රජය සතු ගුවන් සමාගමක් ලෙස , විශ්‍රාමික භවතුන්ටත්, රාජ්‍ය සේවයේ භවතුන්ටත්, විශේෂ සහනයක් සැලසීම පිණිස හඳුන්වාදෙන වැඩ පිළිවෙලකි.

අප දන්නා පරිදි බොහෝ බෞද්ධ පිරිස් දඹදිව වන්දනාව සඳහා දැඩි ඇල්මක් දක්වති. නමුත් ඒ සඳහා යන සම්පූර්ණ වියදම එකවර දරා ගැනීමට ඇති අපහසුව නිසා ජීවිතයේ එක්වරක් හෝ තම සුවිශේෂී අපේක්ෂාව මුදුන්පත් කරගැනීමට අපහසුව ලත වීමෙන් කල් ගෙවති.

ඔවුන් සඳහා සහනදායි වාරික ගෙවීම් මත ගුවන් ටිකට් පත ලබාදීමේ වැඩ පිලිවෙලක් හඳුන්වාදීමට අදහස්කලෙමු. ඒ අනුව දඹදිව දක්වා ගුවන්ටිකට් පතෙහි වටිනාකම රු:38250.00 කි. එහි මාසික වාරිකය රු:3825.00ක් වන අතර මීට අමතරව රු:2200.00ක් ගුවන් තොටුපල බද්ද ටිකට්පත ලබාගැනීමේදි ගෙවිය යුතුය. එම මුදලද මුල් වාරිකය සමග වැටුපෙන් අඩුකර එවන්නේනම් එය රු:6025.00 කි. එතැන් සිට ඉතිරි වාරික නවය රු:3825.00 බැගිනි. ගෙවීම් නිළධාරි විසින් එම වාරික මාසිකව මිහින් ලංකා වෙත එවිය යුතුය.

මෙම සහනදායි වැඩ පිළිවෙල තුල ටිකට්පත නිකුත් කිරීම පමණක් කළ හැකිය. එවිට බරණැස හෝ බුද්ධගයා සිට අදාල පූජණීය ස්ථාන වන්දනා කිරීම, නැරඹීම ආදී අභ්‍යන්තර වාරිකාව තමන් විසින් සැලසුම් කර ගත යුතුය. ඒ සඳහා ලියාපදිංචි දේශීය සංචාර සංවිධායක ආයතන රැසක් ඇත. එම ආයතන පිළිබඳව විස්තර මීට යා කර ඇති පත්‍රිකාව මගින් හෝ දුරකථන අංක 0117800354/355 ඇමතීමෙන් ලබාගත හැකිය.

මීට අතිරේකව මෙම ක්‍රමය යටතේ කතෝලික බැතිමතුන්ටද කොළඹ සිට ට්‍රිචි දක්වා ගොස් වේලන්කන්නිහි ආරොග්‍ය දේවමාතාවන්ගේ ආශීර්වාදය ලබාගැනීම පිණිස යාමට හැකිය. ඒ සඳහා වන ටිකට්පත බදු සහිතව රු: 18000.00 කි. එවිට මාසික වාරිකය රු:3000.00 කි වාරික 6 කින් ගෙවීම් සම්පූර්ණ කල යුතුය.

දැනට සේවයේ නියුතු රාජ්‍ය නිළධාරීන්ට තම අභිමතය පරිදි මෙම පදනම මත තමාට තම කිට්ටුම ඥාතියකුට හෝ දෙදෙනකු සඳහා වුවද ටිකට්පත් ලබාගෙන ඔවුන්ට මෙම අවස්ථාව ලබාදිය හැකිය. රාජ්‍ය සේවයේ නියුතු භවතුන් මේ සමග යා කරන ණ 03 දරණ ආදර්ශ ආකෘතියට අනුව පිළිවෙළ කල අයදුම් පත්‍ර දෙපාර්ථමේන්තු/ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කලයුතුය. එවිට ආයතන ප්‍රධානි ඔහු හෝ ඇය විසින් සහතික කරන ලද ණ 4 දරණ පෝරමය අදාල මුල් වාරිකය සමග මිහින් ලංකා වෙත යොමු කළ යුතු අතර, ඉතිරි වාරික අඛණ්ඩව මාසික වාරික 9 කින් මිහින් ලංකා වෙත එවිය යුතුය. එම චෙක්පත සමග අවකරණ ලේඛණ පිටපත එවීම සෑහේ. ලිපිනය : සී/ස මිහින් ලංකා, අංක 61, ඩබ් ඩී රාමනායක මාවත , කොළඹ 02/චෙක්පත් "මිහින් ලංකා (පෞ) සමාගම හෝ MIHIN LANKA (PVT) LTD ලෙස ලිවිය යුතුය.

රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල ස් ථිර සේකයන්ටද මෙම වැඩ සටහන අදාල වේ. ණය ලාභියා ස්ථිර සේවකයකු බව ණ 4 පෝරමයෙහි අදාල ආයතන ප්‍රධානියා විසින් සහතික කර නිළ මුද්‍රාව තැබිය යුතුයි.

රාජ්‍ය සේවයේ නියුතු භවතුන්ගේ විවේක වාරිකා සඳහා ඩුබායි,ඩකා, ජකර්තා, සාජා ගමනාන්තයන් වෙත වුවද යාමට ද මෙම ක්‍රමය යටතේ ගුවන් ටිකට්පත් නිකුත් කෙරේ. එම ටිකට්පතෙහි මාසික වාරිකය ගමනාන්තය අනුව වෙනස් වේ. වීසා වෙනම පිළිවෙල කරගත යුතුය. ඒ ගැන විස්තර 0117800321ඇමතීමෙන් ලබාගත හැකිය.

මීට අමතරව විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආබාධිත රණවිරුවන් සඳහාත් දිවිපිදූ රණවිරු යැපෙන්නන් සඳහාත් මෙම සහන ක්‍රමයටම ගුවන් ටිකට්පත් ලබාගත හැකිය. ඒ පිළිබඳව අවශ්‍ය උපදෙස් හා පෝරම යුද , නාවික,ගුවන් හමුදා සහ පොලිස් මූලස්ථානයන් වෙත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් යවා ඇත. අවශ්‍ය අයට මිහින් ලංකා ඇමතීමෙන්ද එවා ලබාගත හැකිය. විශ්‍රාමිකයන් සඳහා වන විස්තර ප්‍රා.ලේ වරුන්ගෙන්ද ලබාගත හැකිය. අධ්‍යාපන අමාත්‍යාංශයට අදාල සියළුම නිළධාරීන් සඳහා අධ්‍යා.ලේ.ගේ 26/2011 චක්‍ර ලේකය නිකුත් කර ඇත.

මෙම වැඩපිළිවෙල පිළිබඳව කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වේ නම් අංක 0117800354/355 ඔස්සේ ගාමිණී අබේවර්ධන මහතා (කළමනාකරු රාජ්‍ය හා පොදු කටයුතු) ඇමතීමෙන් පැහැදිලි කරගත හැකිය.

කපිල චන්ද්‍රසේන
ප්‍රධාන විධානය නිළධාරි
සී/ස මිහින් ලංකා